“කවරෙකු ගිවිසගත් අයකු මරා දැමුවේ ද ඔහු ස්වර්ගයේ ගන්ධය ආග්රාණය නොකරන්නේමය. සැබැවින්ම එහි ගන්ධය වසර හතළිහක දුරකින් සොයා ගනු ඇත.”

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර් තා කරන ලදී. “කවරෙකු ගිවිසගත් අයකු මරා දැමුවේ ද ඔහු ස්වර්ගයේ ගන්ධය ආග්රාණය නොකරන්නේමය. සැබැවින්ම එහි ගන්ධය වසර
හතළිහක දුරකින් සොයා ගනු ඇත.”
[صحيح] [رواه البخاري]

දේවත්වය ප්රතික්ෂේප කරන්නන්ගෙන් ඉවත්ව ගිවිසුමක් හා ආරක්ෂාවක් ඇතිව ඉස්ලාමයේ නිවහනට පිවිසුණු අයකු කවරෙකු විසින් මරා දමනු ලැබුවෙ ද ඔහු කිසිවිටෙක ස්වර්ගයේ ගන්ධය ආග්රාණය නොකරන බවත් එම ගන්ධය වසර හතළිහක් ගමන් කරන දුරින් පිහිටන බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දැඩිසේ අවවාද කරමින් පැහැදිලි කර සිටියි.

http://www.sunnah.global/hadeeth/si/show/64637